සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

**10 ශ්‍රේණිය** Grade 10

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I**

**විනාඩි 30 යි.** 30 Seconds

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන පිළිතුරු පත්‍රයේ (X) ලකුණ සටහන් කරන්න.

01. අතීත මානවයා භාවිතා කළ සන්නිවේදන මාධ්‍යයකි.
(1) මුහුණු පොත (Face book) (2) ටැබ් යන්ත්‍රය (3) රූපවාහිනිය (4) ධජ එසවීම

02. සතුන් සන්නිවේදනය කිරීමට ප්‍රධාන හේතුව,
(1) ආහාර හා ආරක්ෂාව සපයා ගැනීම සඳහා ය.
(2) මානවයා සන්නිවේදනයට හුරුවන නිසා ය.
(3) ශබ්දය හා ආලෝකය පරිසරයට මුදා හැරීම සඳහා ය.
(4) සිරිත් - විරිත් ක්‍රියාත්මක කරන්නට සිදුවන නිසා ය.

03. දෘශ්‍ය සන්නිවේදනය යොදාගත් ආදිතම අවස්ථාවක් දැකිය හැකි ස්ථානයකි.
(1) බටදොඹලෙන (2) ප්‍රංශයයේ ලැස්කෝ ලෙන
(3) අජන්තා එල්ලෝරා ලෙන (4) ඊජිප්තු පිරමීඩවල

04. සාම්ප්‍රදායික සන්නිවේදනය සම්බන්ධයෙන් 10 ශ්‍රේණියේ සිසුන් සිව් දෙනෙකු අතර ඇති වූ සංවාදයක් පහත දැක්වේ.
A ගෝත්‍රික සමාජවල පණිවිඩ හුවමාරුවට මෙම මාධ්‍ය ප්‍රබලව යොදා ගත්තේ ය.
B ලෝකයේ සෑම ජන කණ්ඩායමක්ම මෙම මාධ්‍ය භාවිත කර ඇති බව මගේ විශ්වාසයයි.
C මිත්‍යාමය බලවේග මගින් සාම්ප්‍රදායික මාධ්‍ය වඩාත් නිර්මාණශීලී කර ඇත.
D මෙකී මාධ්‍ය වර්ගය ජනකණ්ඩායමේ සුවිශේෂී බව පෙන්වීමට යොදගත හැකි ප්‍රබල සාක්ෂියක් බව මම ප්‍රකාශ කරනවා.
මේ අතුරින් නිවැරදි අදහස් ඉදිරිපත් කර ඇත්තේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A,B හා C පමණි. (4) A,B,C හා D යන සියල්ලම

05. රූපාක්ෂර සහිත භාෂාවකි.
(1) ඉංග්‍රීසි භාෂාව (2) කොරියන් භාෂාව
(3) ඇවෙස්ටන් භාෂාව (4) ග්‍රීක භාෂාව

06. "බලපෑම" පදනම් කරගෙන සන්නිවේදනය පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කළ විද්‍යාඥයා වන්නේ,
(1) විල්බර්ශ්‍රාම් ය. (2) ෂැනොන් - වීවර් ය. (3) ලැස්වෙල් ය.(4)චාල්ස් කුලී ය.

07. මුද්‍රිත මාධ්‍යයක් වන්නේ,
(1) අන්තර්ජාලය යි. (2) රූපවාහිනිය යි. (3) ගුවන්විදුලිය යි. (4) බිල් බෝඩ් ය.

08. සන්නිවේදන ක්‍රියාවලියක් පවත්වාගෙන යාමට අවශ්‍ය වනුයේ,
(1) සන්නිවේදකයා යි.(2) පණිවිඩය යි. (3) නාලිකාව යි. (4) ග්‍රාහකයා යි.

09. පුද්ගලයෙකුගේ චර්යාව, චත් පිළිවෙත් සෑදීමට උපකාරී වන්නේ,
(1) සමාජානුයෝජනය යි. (2) පෙළඹවීම යි. (3) සංවාද සාකච්ඡාව යි. (4) සුපරීක්ෂණය යි.

10. සුනිමල් තම පියාගේ ගමට යන මාවත සොයා ගැනීමට නොහැකි වූයේ අදාළ මාවත දක්වන පුවරුව අවපැහැගැන්වී තිබීම හේතුවෙනි. මෙම තත්ත්වය,
(1) ග්‍රාමීය දෝෂයකි. (2) අර්ථ බාධකයකි. (3) ශාරීරික බාධකයකි. (4) මාධ්‍ය බාධකයකි.

11. "කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සන්දේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම......"
(1) දොරටුපාල සංකල්පයයි. (2) සංජානන සංකල්පයයි.
(3) හැසිරීම් න්‍යායයි. (4) බහු බුද්ධි න්‍යායයි.

12. දොරටුපාල සංකල්පය සම්බන්ධ පහත ප්‍රකාශ නිරීක්ෂණය කරන්න.
A පුවත් වාරණය වීම අනිවාර්යයෙන්ම සිදුවේ.
B රජයකට වාසිදායක ලෙස යොදාගත නොහැකි සංකල්පයකි.
C පුවත් විකෘතිවීමක් දොරටුපාල සංකල්පය නිසා දැකිය හැක.
මේ අතුරින් නිවැරදි වනුයේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A හා C පමණි. (4) සියලුම ප්‍රකාශ අසත්‍ය වේ.

13. කම්බි රහිතව විදුලි සංඥා යැවීම මගින් දුර විකාශන ක්‍රමය සොයාගත්තේ,
(1) මාර්කෝනි ය. (2) මෝස් ය. (3) ග්‍රැහැම් බෙල් ය. (4) ජේම්ස් ක්ලාක් මැක්ස්වෙල් ය.

14. පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) පුද්ගලයන්ගේ මනෝභාවයන් අතර සමානතාවක් ඇත.
(2) පුද්ගලයන්ගේ තීරණ ගැනීමේ හැකියාව රඳා පවතින්නේ සිතීමේ හැකියාව මත වීම සත්‍යයක් වනු ඇත.
(3) පංචේන්ද්‍රිය සිතිවිලි සමඟ ප්‍රතික්‍රියා කිරීමෙන් හැඟීම් (Feelings) උපදවනු ඇත.
(4) පුද්ගල මතකය අවදි වීම අන්තර්වර්තී සන්නිවේදන අවස්ථාවක් වනු ඇත.

15. රූපයේ දක්වා ඇත්තේ අවිධිමත් ආකෘතියකි. එහි තොරතුරු හුවමාරුව සිදුවන ආකාරය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.




(1) එක් එක් පුද්ගලයා පිළිවෙලකට තොරතුරු ලබා දෙයි.
(2) ආරම්භකයා විසින් තමා තෝරාගත් කිහිපදෙනෙකුට තොරතුරු ලබා දෙයි.
(3) එක් පුද්ගලයෙකුගෙන් බොහෝ පුද්ගලයන්ට තොරතුරු ලබා දෙයි.
(4) එක් අයෙකුගෙන් තවත් අයෙකුට ලැබී, ඊට පසුව දෙතුන් දෙනෙකුට තොරතුරු ගලායයි.

16. සන්නිවේදන බාධක පහසුවෙන්ම හඳුනාගත හැකි ආකෘතිය ඉදිරිපත් කළේ,
(1) විල්බර් ශ්‍රාම් ය. (2) බර්ලෝ ය. (3) මාෂල්මැක්ලුහන් ය. (4) ෂැනොන් - වීවර් ය.

17. පාරභාෂාමය ක්‍රමය (Paralanguage) අයත් වන සන්නිවේදන ස්වරූපය,
(1) ලිඛිත සන්නිවේදනය නම් වේ. (2) අවාචික සන්නිවේදනය නම් වේ.
(3) වාචික සන්නිවේදනය නම් වේ. (4) ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදනය නම් වේ.

18. මහේෂ් හා සුරේෂ් සමීප මිතුරන් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා පසුදින පැවැත්වෙන විභාගයේ විෂයට අදාළ කරුණු පිළිබඳව එකිනෙකාගෙන් ප්‍රශ්න කරමින් සිටියේ ය. එබඳු අවස්ථාවක දක්නට ලැබෙන්නේ,
(1) අන්තර් පුද්ගල සන්නිවේදනයයි. (2) සමූහ සන්නිවේදනයයි.
(3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි. (4) ජන සන්නිවේදනයයි.

19. ප්‍රතිපෝෂණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ග්‍රාහක ප්‍රතිචාරය සන්නිවේදකයාට ළඟාවීම අත්‍යවශ්‍ය නොවනු ඇත.
(2) රේඛීය සන්නිවේදන ක්‍රියාවලියක් තුළ පමණක් දෘෂ්‍යමාන වනු ඇත.
(3) සන්නිවේදක කේන්ද්‍රිය තොරතුරු හුවමාරු ක්‍රියාවලියක් තුළ දැකිය හැකි වනු ඇත.
(4) කථන හා ලිඛිත සන්නිවේදනයේ ඵලදායිතාව වැඩි කරන්නක් වනු ඇත.

20. එක්තරා කථිකයෙක් තම කථාව අතර තුර සමූහයේ සෑම දෙනාම කෙරෙහි විනාඩියකට දෙවරක් ඇසි බැල්මක් හෙළනු ලැබීය. කථිකයා අනුගමනය කළ න්‍යායාත්මක උපක්‍රමය හඳුන්වනු ලබන්නේ,
(1) නායකත්වය ප්‍රදර්ශනයක් ලෙස ය. (2) සිද්ධි ආශ්‍රිත කථාවක් ලෙස ය.
(3) ප්‍රදීපාගාර උපක්‍රමය ලෙස ය. (4) විනෝදයෙන් අධ්‍යාපනය ලබා දීම සඳහා ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

**පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු**
First Term Test, March 2019

| | | |
|---|---|---|
| **10 ශ්‍රේණිය** Grade 10 | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** | පැය දෙකයි වි. 30 Two & Half hours |

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට හිමි උපරිම ලකුණු ගණන 20 කි.

(01) කෙටි පිළිතුරු සපයන්න.

10 ශ්‍රේණියේ සන්නිවේදන විෂය හදාරන සිසුවෙකුගේ සටහන් පොතේ පහත රූප සටහන අන්තර්ගත විය. ඒ ආශ්‍රයෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) රූපයේ හිස්තැනට සුදුසු මාතෘකාවක් ලියා දක්වන්න.

(ii) ලෝකයේ තාක්ෂණය කොතරම් ප්‍රබල වුවත් පුද්ගලයා සන්නිවේදනයට අවශ්‍ය බව ප්‍රකාශ වන ආකාරය නම් කරන්න.

(iii) ද්වි මාර්ගික සන්නිවේදන සූත්‍රය රූප සටහනකින් නිරූපණය කරන්න.

(iv) දොරටුපාල සංකල්පය අනිවාර්යයෙන්ම හා ප්‍රබලව ක්‍රියාත්මක වන ආකාරය තෝරා ලියන්න.

(v) අන්තර්ජාලය හා ස්මාර්ට් ජංගම දුරකථනය නිසා සියලුම ජන සන්නිවේදන මාධ්‍ය ඒකාබද්ධ වී ඇත. මෙම මාධ්‍ය ප්‍රවණතාව හඳුන්වන නම ලියන්න.

(vi) සමූහ සන්නිවේදන ක්‍රියාවලියේදී ඉදිරිපත් කරන්නා හා සමූහ අතර සම්බන්ධය ගොඩනැංවීමට අවශ්‍ය සාධක දෙකකි. සඳහන් කරන්න.

(vii) A අක්ෂරය හැර ප්‍රතිපෝෂණය කඩිනමින් ලැබෙන අක්ෂරය නම් කරන්න.

(viii) සන්නිවේදන ක්‍රියාවලියේදී අධිතාක්ෂණයක් භාවිත කිරීමට සිදුවන අක්ෂරය නම් කරන්න.

(ix) ජනසන්නිවේදනයේ සමාජ බලපෑම් දෙකකි. කෙටියෙන් විස්තර කරන්න.

(x) පුද්ගලාන්තර සන්නිවේදනය හා සමූහ සන්නිවේදනය අතර වූ වෙනස්කම් දෙකක් සංසන්දනාත්මකව ලියන්න. (ලකුණු 2x10=20)

02 10 ශ්‍රේණියේ සන්නිවේදනය විෂය හදාරන සිසුන් පිරිසක් පාසල් පාදක ඇගයීමක් (SBA) සඳහා ක්‍රියාකාරී ගීත (Action Song) ඇල්බමයක් නිර්මාණය කරන ලදී. එම ගීත ශ්‍රවණය කරන ලද සහෝදර සිසුන් පිරිසක් එකී ගීත ගයමින්, නටමින් මෙම ඇගයීමට අපූර්වත්වයක් එක්කරන ලදී.

(i) ක්‍රියාකාරී ගීත මගින් සිසුන් සාධනය කරගැනීමට බලාපොරොත්තුවන ප්‍රධාන සන්නිවේදන අරමුණු දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ගීත ඇල්බමය සිසුන් නිර්මාණය කරගත්තේ ගුවන් විදුලියට සවන් දීමෙනි. ගුවන් විදුලියේ අන්තර්ගත ජනසන්නිවේදනමය ලක්ෂණ හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iii) සහෝදර සිසුන් ගීත ගයමින් නටන අවස්ථාවේදී දැකිය හැකි අවාචික සන්නිවේදන ක්‍රම තුනක් පෙන්වා දෙන්න. (ල. 06)

(iv) ගීත ඇල්බමය ශ්‍රවණය කිරීමේදී ප්‍රධාන සන්නිවේදන බාධක දෙක ක්‍රියාත්මක වන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 08)

03 අ.පො.ස.(සා/පෙළ) විභාගයේ සිංහල භාෂාව සඳහා රචනය ලිවීම අනිවාර්යය වන අතර, එම ලේඛනය ඵලදායිවන තරමටම වැඩි ලකුණු ප්‍රමාණයක් හිමිවන බව ගුරුතුමා සිසුන්ට පැවසීය.

(i) ඉහත "රචනය ලිවීම" අයත්වන සන්නිවේදන ස්වරූපය / විධිය නම් කරන්න. (ල. 02)

(ii) භාෂාව සිසුන්ට ඉටුකරදෙන මූලික කාර්යයන් හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iii) වාචික සන්නිවේදන ස්වරූපටය වඩා ඉහත ඔබ (i) හි නම් කළ සන්නිවේදන ස්වරූපය විධිමත්ය. ඔබ මේ ප්‍රකාශනයට එලගවේද? කරුණු තුනක් ඇසුරෙන් ඔබගේ ප්‍රකාශය සනාථ කරන්න. (ල. 06)

(iv) සා.පෙළ ශ්‍රේණියේ සිසුවකු විසින් ලියන ලද සිංහල රචනයකට ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් හිමිවිය. මෙයට බලපා හැකි සන්නිවේදන විද්‍යාත්මක හේතු හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)